# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## අධිකරණ සංවිධාන (සංශෝධන)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා
විසින් 2025 දෙසැම්බර් මස 18 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 නොවැම්බර් මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[**44** වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 14.40** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත හෝ එවැනි යම් ලිඛිත නීතියක් යටතේ, යම් තැනැත්තකු විසින් මහ මුහුදේ දී සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් වන සියලු අපරාධ නඩු සහ අධිචෝදනා, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය විසින් විභාග කරනු ලැබීම, නඩු විභාග කරනු ලැබීම සහ තීරණය කරනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

එල්. ඩී. -ඕ 38/2024

## 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක        දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 2 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) යම් තැනැත්තකු විසින් මහ මුහුදේ දී සිදු කරන ලද යම් වරදක්-

(i) අන්තර්ජාතික නීතිය අනුව මුහුදු කොල්ලයක් වන අවස්ථාවක දී, එවැනි යම් වරදක්; හෝ

(ii) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත හෝ එවැනි යම් ලිඛිත නීතියක් යටතේ වූ වරදක් වන අවස්ථාවක දී, එවැනි යම් වරදක්;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

PL 15591 - 342 (2025/12)